දුරකථන
தொலைபேசி
Telephones } 011-2136600
011-2136650

ලේකම්
செயலாளர்
Secretary } 011-2136602

ෆැක්ස්
தொலைநகல்
Fax } 011-2876169
011-2876181

විද්‍යුත් තැපැල
மின் - அஞ்சல்
E-mail } info@psc.gov.lk

වෙබ් අඩවිය
இணையத்தளம்
Website } www.psc.gov.lk

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்
OFFICE OF THE PUBLIC SERVICE COMMISSION

අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල
இல. 1200/9, இராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை.
No. 1200/9, Rajamalwatta Road, Battaramulla

මගේ අංකය
எனது இல.
My No. } PSC/APL/1/AT/2018

ඔබේ අංකය
உமது இல.
Your No. } COMS/Trans/වා.ස්.මා.
/2019

දිනය
திகதி
Date } 2019.02. 26

ලේකම්
රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය

**2019 වාර්ෂික ස්ථාන මාරු නියෝග සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව**
**වෙත ඉදිරිපත් කර ඇති අභියාචනාවලට අදාළ තීරණ දැනුම් දීම**
**ශ්‍රී ලංකා පරිපාලන සේවය, ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය, ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවය**
**සහ රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ අධි ශ්‍රේණිය**

ඉහත සඳහන් සේවාවන්හි නිලධරයන් සම්බන්ධයෙන් ඔබ විසින් අනුමත කරන ලද 2019 වාර්ෂික ස්ථාන මාරු නියෝගවලට එරෙහිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද අභියාචනාවලට අදාළව එම කොමිෂන් සභාව විසින් ලබා දී ඇති තීරණ මේ සමඟ ඔබ වෙත එවමි.

02. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සලකා බලන ලද අභියාචනා සම්බන්ධයෙන්, එම කොමිෂන් සභාව විසින් ලබා දී ඇති තීරණවලට යටත්ව, ක්‍රියාත්මක විය යුතු දින සම්බන්ධයෙන් විශේෂයෙන් සඳහනක් කර නොමැති සියළු ස්ථාන මාරු 2019.03.01 දින සිට ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු කරන ලෙස ඔබ වෙත කාරුණිකව දන්වා සිටිමි. ඒ අනුව, ඉහත සඳහන් සේවාවන්වල 2019 වර්ෂයේ වාර්ෂික ස්ථාන මාරුවීම් ක්‍රියාත්මක කරන ලෙසත්, වාර්ෂික ස්ථාන මාරුවීම් ලද නිලධාරීන් මේ සම්බන්ධයෙන් දැනුවත් කරන ලෙසත් මෙයින් දන්වමි.

03. එක් එක් නිලධාරියා සම්බන්ධයෙන් වෙන වෙනම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය දන්වා එවීමට කටයුතු කරනු නොලැබේ. මේ සම්බන්ධයෙන් 2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනතේ 2 (ඇ) සහ (ඈ), 3 සහ 4 යන වගන්ති කෙරෙහි ඔබගේ අවධානය යොමු කරනු ලැබේ.

04. රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද අභියාචනා සම්බන්ධයෙන් එම කොමිෂන් සභාව විසින් ලබා දී ඇති තීරණයකින් අතෘප්තියට පත්වන රජයේ නිලධරයකුට 2002 අංක 04 දරණ පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරය පනතේ විධිවිධානවලට අනුකූලව පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමට හිමිකම ඇත්තේය. එසේවුවද, ඉදිරිපත් කරනු ලබන අභියාචනා සඳහා පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරයේ අවසන් තීරණයක් ලැබෙන තෙක් ලබා දී ඇති ස්ථාන මාරු නියෝගය එලෙසම ක්‍රියාත්මක විය යුතු බවද කාරුණිකව දැනුම් දෙමි.

...02/-

05. 2019 වාර්ෂික ස්ථාන මාරු නියෝග ලබා සිටින සියළුම නිලධාරීන් නියමිත දිනයේ නව සේවා ස්ථානයේ රාජකාරි භාර ගැනීමට හැකිවන පරිදි අනුප්‍රාප්තිකයින් පැමිණෙන තෙක් රඳවා නොගෙන වර්තමාන සේවා ස්ථානවලින් මුදාහැරීමට කටයුතු කිරීම සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්ගේ, දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ හා ආයතන ප්‍රධානීන්ගේ වගකීම වන අතර, එය නිවැරදිව සිදු වන්නේ ද යන්න පිළිබඳව පුළුල් අධ්‍යයනයක් හා පසුවිපරමක් සිදු කරන ලෙස ද ඔබ වෙත දන්වා සිටිමි.

06. වාර්ෂික ස්ථාන මාරු නියෝග මත නියමිත පරිදි නව සේවා ස්ථාන වෙත රාජකාරි සඳහා වාර්තා නොකර සිටින නිලධරයකු සම්බන්ධයෙන් එම නිලධරයා ස්ථාන මාරුව ලබා ඇති දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ ප්‍රධානියා විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති 217 වගන්තිය අනුව, තනතුර අතහැර යාමේ නිවේදනයක් නිකුත් කිරීමට කටයුතු කළ යුතු අතර දෙපාර්තමේන්තු හා ආයතන ප්‍රධානීන් එසේ කටයුතු කරන්නේද යන්න පිළිබඳව ඔබ විසින් අධීක්ෂණය කළ යුතු වේ.

07. තවද, 2019 වාර්ෂික ස්ථාන මාරු නියෝග ක්‍රියාත්මක කිරීමේ දී අමාත්‍යාංශ වෙනස් වීම හේතුවෙන් යම් නිලධරයකු ස්ථාන මාරුවිය යුතු සේවා ස්ථානය පිළිබඳ ගැටළු සහගත තත්ත්වයක් පවතින අවස්ථාවක දී, අදාළ නිලධරයා අනුප්‍රාප්තිකයා වශයෙන් සලකනු ලබන නිලධරයා සේවයේ යෙදී සිටින ස්ථානය ඔහුගේ/ඇයගේ නව සේවා ස්ථානය විය යුතු බව ද වැඩිදුරටත් දන්වා සිටිමි.

**එම්.ඒ.බී. දයා සෙනරත්**
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව

පිටපත
01 අදාල අමාත්‍යාංශ ලේකම්වරුන් හා දෙපාර්තමේන්තු ප්‍රධානීන් - කාරුණික දැ.ගැ.ස. සහ අ.ක.ස